පළාත් පාලන චක්‍රලේඛ : අංක 2022/01

මගේ අංකය : PL/7/8/32

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

අංක 330, යුනියන් පෙදෙස

කොළඹ 02

2022.12. 15

සියළුම පළාත් පාලන ආයතන ප්‍රධානීන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

පළාත් පාලන කොමසාරිස්වරුන්

**<u>පළාත් පාලන ආයතන සපයන සේවා සඳහා තොරතුරු තාක්ෂණික විසඳුම් ලබා දීම.</u>**

2022 අංක 30 දරණ විසර්ජන පනත සංශෝධනය කිරීම යටතේ 2022. 08.30 වන දින ඉදිරිපත් කරන ලද අතුරු අයවැය යෝජනා අනුව එහි 10.4 වගන්තිය ප්‍රකාරව සියලුම පළාත් පාලන ආයතන විසින් මහජනයා වෙත ලබා දෙන සේවා පහසු කිරීම, කාර්යක්ෂම කිරීම සහ ආදායම් කඩිනමින් එක්රැස් කිරීම සඳහා මාර්ගගත ක්‍රමවේද හඳුන්වා දීම අනිවාර්යය වේ.

02. රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් අංක PA/PCLG – 14/53/2022 හා 2022.10.20 දිනැතිව "2022 වසරේ අතුරු අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම" යන මැයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරනු ලදුව, ඒ සඳහා ලද අංක 22/1687/605/2022 හා 2022.11.15 දිනැතිව ලද අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව දැනට මාර්ගගත ක්‍රමවේද භාවිතා නොකරන පළාත් පාලන ආයතන සඳහා වයඹ සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දෙනු ලැබූ CAT 2020 පරිගණක මෘදුකාංගය භාවිතා කිරීමට තීරණය කර ඇත.

03.මීට ප්‍රථම පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් මාර්ගගත ක්‍රමවේද ඔස්සේ මහජනතාවට සේවා සැපයීමට අදාලව අංක 2018/ඉ-පළාත් පාලන-01 හා 2018.07.19 දිනැතිව නිකුත් කරන ලද "ඉ- පළාත් පාලන පද්ධතිය පළාත් පාලන ආයතනවල ස්ථාපනය කිරීම හා පළාත් පාලන ආයතන වෙත විද්‍යුත් ක්‍රම මඟින් ගෙවීම් ලබා ගැනීම ක්‍රියාත්මක කිරීම." මැයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛය වෙනුවට මෙතැන් පටන් මෙම චක්‍රලේඛයේ විධිවිධාන බලාත්මක වේ.

04. ඔබ පළාත් පාලන ආයතනය මේ වන විටත් කුමන හෝ තොරතුරු තාක්ෂණ පද්ධතියක් භාවිතා කරමින්, මාර්ගගත ක්‍රමවේද ඔස්සේ සේවා පහසුකම් සපයනු ලබන්නේ නම් හෝ එවැනි ක්‍රමවේදයකට

පිවිස ඇත්නම් එම පද්ධතිය 2022/12/31 දින වන විට මාර්ගගත ක්‍රමවේදයකට ඇතුළත් කොට මහජන සේවාව ඒ අනුසාරයෙන් පවත්වාගෙන යාම අනිවාර්යය වන අතර එවැනි පළාත් පාලන ආයතන CAT 2020 පරිගණක මෘදුකාංගය භාවිතා කිරීම අවශ්‍ය නොවේ.

05. මේ වන විට ඔබ පළාත් පාලන ආයතනය කුමන හෝ මාර්ගගත ක්‍රමවේදයකට අනුගතව මහජනතාව වෙත සේවා සැපයීමට අපොහොසත්ව ඇති නම් අංක 22/1687/605/2022 හා 2022/11/15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව වයඹ සංවර්ධන අධිකාරිය විසින් පළාත් පාලන ආයතන වෙත හඳුන්වා දී ඇති **CAT 2020** තොරතුරු තාක්ෂණ පද්ධතියට ඔබ පළාත් පාලන ආයතනය අනුගත වීමට එකඟතාවය පල කර 2022.12.31 දිනට පෙර එම පද්ධතිය තම පළාත් පාලන ආයතනයට හඳුන්වාදීමට කටයුතු කළ යුතුය.

06. 2022 අංක 30 දරණ විසර්ජන පනතේ විධි විධාන ප්‍රකාරව ඔබ පළාත් පාලන ආයතනය පෙර සඳහන් කුමන හෝ ක්‍රමවේදයක් අනුගමනය කර **2022.12.31** දිනට පෙර මාර්ගගත ක්‍රමවේද ඔස්සේ මහජන හිතෛෂී සේවා පවත්වාගෙන යායුතු බව අවධාරණය කරමි.

**එම්. එම්.පී.කේ මායාදුන්නෙ**
ලේකම්
රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකතන අංකය -0112345971
විද්‍යුත් තැපැල -saslg@pclg.gov.lk

**පිටපත්**

| | |
|---|---|
| 01. ජනාධිපති ලේකම් | - කා.දැ.ගැ.ස |
| 02. විගණකාධිපති | - කා.දැ.ගැ.ස |
| 03. පළාත් පාලන විෂය භාර පළාත් අමාත්‍යාංශ ලේකම්වරු | - කා.දැ.ගැ.ස සහ සහයෝගය ලබා දීම සඳහා |
| 04. සියළුම නාගරික කොමසාරිස්වරුන් | - අවශ්‍ය කටයුතු කඩිනම් කිරීම සඳහා |
| 05. සියළුම සහකාර පළත් පාලන කොමසාරිස්වරුන් | - ,, |
| 06. සියළුම ප්‍රාදේශීය සභා ලේකම්වරුන් | - ,, |